**සියලු ම ප්‍රශ්ණවලට පිළිතුරු සපයන්න**

(01) ව්‍යවසායකත්වය හැඳින්වීමට අදාළ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

(අ) 'සිතන, තර්කකරන හා ක්‍රියාකරන ආකාරයකි'

(ආ) 'මිනිස් චින්තනය හා බැඳුණකි'

(ඉ) වර්තමානය වෙනස් කිරීමට පොළඹවන්නා වූ පුද්ගල මානසික තත්වයකි.

ඉහත ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ --------------------------

**★ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න**

(02) ප්‍රාග්ධනය නැමති නිෂ්පාදන සාධකයට අයත් නොවන්නේ,

1 මුදල් 2 යන්ත්‍ර 3 ගොඩනැගිලි 4 වනාන්තර

(03) 'අනාගත ලෝකයේ සෞඛ්‍ය අංශයේ විප්ලවයක් කිරීම තමාගේ සිහිනය බව සමන් පවසයි ' මෙම ප්‍රකාශයෙන් කියවෙන ව්‍යවසායකත්ව ගුණාංගය වන්නේ,

1 නම්‍යශීලීත්වය 2 ආත්ම විශ්වාසය 3 දැක්ම 4 නිර්මාණශීලීත්වය

(04) ආයෝජනයක ප්‍රතිලාභය ඉහළ නම් එහි අවදානම ,

1 ඉහළය 2 පහළය 3 වෙනසක් නැත 4 මධ්‍යස්ථය

(05) නවෝත්පාදනය සඳහා පදනම්වන මූලාශ්‍රයක් ලෙස 'අනපේක්ෂිත සිදුවීම් ' සඳහා නිදසුනක් වන්නේ,

1 විද්‍යුත් බැංකු ගනුදෙනු 2 මේද හා සීනි සහිත ආහාර

3 ග්‍රැමෆෝනය නිපදවීම 4 දිවා සුරැකුම් මධ්‍යස්ථාන

**★ දී ඇති හිස්තැන් වලට අදාළ නිවැරදි පිළිතුර ලියන්න**

(06) නිෂ්පාදනය සඳහා අවශ්‍ය කෙරෙන මිනිසා විසින් සපයන කායික හා මානසික ප්‍රයත්නය ----------- යි.

(07) ------------යනු පරිසරයේ වෙනස්වීම්වලට උචිතවන පරිදි අනුගත වීමට ඇති හැකියාව වේ.

(08) සාමාන්‍යයෙන් ලාභ අපේක්ෂාවෙන් ව්‍යාපාර කටයුතුවල නිරතවන ව්‍යවසායකයන් ------------------- ලෙස හඳුන්වයි.

(09) මිනිස් අවශ්‍යතා සහ වුවමනා සපුරාලන ඕනෑම දෙයක් -------------------- ලෙස හඳුන්වයි.

(10) මිනිසාගේ ජීවිතය පවත්වාගෙන යෑමට අනිවාර්යයෙන්ම සපුරාගත යුතු දෑ -----------------ලෙස හඳුන්වයි.